# සිංහල ජාතියේ ප්‍රභවය හා බැඳෙන ඉන්දීය සභ්‍යත්වය පිළිබඳ විමසුමක්

**පී. තරිඳු මධුශාන් පීරිස්**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
ptmperis@gmail.com

---

ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ අතීතයේ සිට වර්තමානය දක්වා ම සිංහල ජාතියේ ප්‍රභවය පිළිබඳව පවතින්නේ පොදු එකඟතාවයක් නොවේ. ඉන්දියාවේ සිට පැමිණි ආර්යයන් ශ්‍රී ලංකාවට පැමිණියේ බටහිර ඉන්දියාවෙන් පැමිණි පිරිසකගෙන් ඉවත, නැගෙනහිරින් පැමිණි පිරිසකගෙන් බවත් සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් මෙන් ම නූතන විද්වතුන් අතර පවතින මතවාදයකි. මෙම ලිපියේ අරමුණ වන්නේ සිංහලයන්ගේ ප්‍රභවය පිළිබඳ ව ප්‍රාථමික මූලාශ්‍රයන් වශයෙන් මහාවංසයත්, දීපවංසයේත් ඇති මතවාදයන් පිළිබඳවත් ද්වීතීක මූලාශ්‍රයන්හි ඇති මතවාදයන් පිළිබඳවත් සන්සන්දනාත්මක අධ්‍යයනයක් සිදුකිරීම ය. මේ සඳහා ප්‍රධාන වශයෙන් යොදාගනු ලබන ක්‍රමවේදය වන්නේ මහාවංසයේත්, දීපවංසයේත් සඳහන් ඓතිහාසික තොරතුරු මූලික කරගනිමින් තෝරාගත් ද්වීතීක මූලාශ්‍රයන් කිහිපයක සිංහලයේ ප්‍රභවයට හේතුවූ භූමිය හෙවත් විජය ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට පැමිණියේ ඉන්දියාවේ කිනම් ප්‍රදේශයක සිට ද යන්න පිළිබඳ ව දැක්වෙන්නා වූ තොරතුරු මූලිකාලීන ලාංකීය භාෂා ස්වරූපය ප්‍රධාන වශයෙන් ඇසුරු කරගනිමින් විමර්ශනයක යෙදීම ය. මෙමඟින් ලාංකීය ඉතිහාසය තුළ ප්‍රධාන වශයෙන් පවතින්නා වූ මතවාදයක් වන සිංහල ජාතියේ ප්‍රභවය කිනම් දිශාවකින් පැමිණි පිරිසකගෙන් සිදුවී ද යන්න හා සැබවින් ම ලාංකීය භාෂාව විකසනයේදී ඉන් බලපෑම් ඇති වූ ආකාරයත් මෙමගින් අපේක්ෂිත ප්‍රතිඵලයයි. සැබවින්ම මෙහිලා ප්‍රධාන වශයෙන් ම මහාවංසයේ දැක්වෙන භූමි ශාස්ත්‍රීය නාමයන් ද සලකා බැලීමෙන් සහ වෙනත් විද්වතුන්ගේ මතවාදයන් සැලකිල්ලට ගනිමින් ද ප්‍රධාන වශයෙන් ලාංකීය භාෂා ශෛලිය පිළිබඳව ද විමර්ශනය කරමින් මෙහිදී එළඹෙන නිගමනය වන්නේ සිංහල ජාතියේ ආරම්භකයන් වනාහි නැගෙනහිර ඉන්දියාවෙන් පැමිණි පිරිසක් වන බව ය.

ප්‍රමුඛ පද : ප්‍රාථමික මූලාශ්‍රය, ද්වීතීක මූලාශ්‍රය, ආර්යයන්, සිංහල ජාතිය